**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය - 2018**
---------------------------------------------------------------------------------------------

## 1.1 <u>මතය වියාචනය</u>

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 <u>මතය වියාචනය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------- | --------------------- | ---------- |
| (අ) | ප්‍රමිත 02 හි 18 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි. | මූල්‍ය වර්ෂයේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ විස්තර මේ සමඟ ඉදිරිපත් කරමි. | ප්‍රමිත ප්‍රකාරව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතු බව. |
| (ආ) | ප්‍රමිත 07 හි 57 ඡේදයට පටහැනිව මුළු පිරිවැය රු.38,598,438 ක් වූ පිරිපහදු යන්ත්‍රාගාරයේ යන්ත්‍ර හා ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනාගැනීමකින් තොරව සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි. | පැලියගොඩ වෙළඳ සංකීර්ණයේ ජලපිරිපහදු යන්ත්‍රාගාරයේ යන්ත්‍ර හා ගොඩනැගිලි වෙන් වශයෙන් හඳුනාගැනීමට අපහසුය. ඒ පිළිබඳ ප්‍රවීණතාවයක් ඇති අයෙකු ද නොමැත. | ප්‍රමිත ප්‍රකාර ගොඩනැගිලි හා යන්ත්‍ර වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ක්ෂය ප්‍රතිපාදනය සිදුකළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාර ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.2,412,124 ක් වූ ස්ථාවර වත්කම් 3 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවද එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් 2017 වර්ෂයේදී නැවත ප්‍රත්‍යාගණනය කර ඇත. එම වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලද්දේ ඒ පිළිබඳ ප්‍රවීණතා ඇති අය විසිනි. එම ආයු කාලය අනුව ක්ෂය අනුපාතය තීරණය කර ඇත. | ප්‍රමිත ප්‍රකාර ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමත් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමත් කළ යුතු බව. |

**1.5.3** <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------- | ------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොළිය රු.19,435,713 කට අදාලව ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද ලෙස රු.125,958 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2018 වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.21,949,879 ක් වන අතර එය සියයට 5 බැගින් ගණනය කර රඳවා ගැනීමේ බද්ධ දක්වා ඇත. | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළිය නිවැරදිව හඳුනාගෙන ඒ මත රඳවා ගැනීමේ බදු ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2015 හා 2016 වර්ෂවලදී තැන්පත් කරන ලද නමුත් බැංකු ගිණුමට බැරවී නොතිබුණු කඩ කාමර දෙකක් සඳහා බදු කුලී ආදායම පිළිවෙලින් රු.80,000 ක් හා රු.617,038 ක මුදල නිරවුල් නොකර සමාලෝචිත වර්ෂයේදී ද බැංකු සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරණු ලබන බව. | බැංකුවේ තැන්පත් කරන ලද මුදල් හඳුනාගෙන ප්‍රමාදයකින් තොරව බැංකු ගිණුමට බැර කිරීමටත් ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ශීතාගාර හා පතුරු අයිස් යන්ත්‍රාගාරයේ බදුකරු ගිවිසුම් කොන්දේසි කඩකිරීම හේතුවෙන් අයවිය යුතු රු.2,467,500 ක් වූ හිඟ මුදල ගිණුම් ගත කිරීමට හා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ආයතනය පිළිබඳ නව තොරතුරු ලබා ගැනීම සඳහා සමාගම් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් වෙත ලිපියක් යොමු කර ඇති අතර අදාල තොරතුරු ලැබීමෙන් පසු හිඟ මුදල් අයකර ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | හිඟ මුදල් අයකර ගැනීමටත් ලැබිය යුතු බදු ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායම හා ලැබිය යුතු බදු කුලී ආදායම රු.66,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. | ඉදිරිපත් කර නොතිබුණි. | ගිවිසුම අනුව වාර්ෂික බදු කුලී ආදායම ගණනය කර ගිණුම්ගත කළ යුතු බව. |

**1.5.4 <u>නොසැසඳු පාලන ගිණුම්</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ලෙජර් ගිණුම් 8 | 1,337,146,047 | 1,376,336,695 | 39,190,648 | භාරය විසින් පවත්වාගෙන යනු ලබන ලෙජරයේ සඳහන් ශේෂය නිවැරදි නොවේ. නමුත් ශේෂ පිරික්සුම නිවැරදිව පිළියෙල කර ඇත. | නිවැරදිව ලෙජර් ගිණුම් පිළියෙල කර ඒ අනුව ශේෂ පිරික්සුම සකස් කළ යුතු බව |
| (ආ) | ලෙජර් ගිණුම් 12 | 382,326,642 | 344,736,524 | 37,590,118 | භාරය විසින් පවත්වාගෙන යනු ලබන ලෙජරයේ සඳහන් ශේෂය නිවැරදි නොවේ. නමුත් ශේෂ පිරික්සුම නිවැරදිව පිළියෙල කර ඇත. | නිවැරදිව ලෙජර් ගිණුම් පිළියෙල කර ඒ අනුව ශේෂ පිරික්සුම සකස් කළ යුතු බව |
| (ඇ) | ලෙජර් ගිණුම් 08 | 0 | 155,034,055 | 155,034,055 | භාරය විසින් පවත්වාගෙන යනු ලබන ලෙජරයේ සඳහන් ශේෂය නිවැරදි නොවේ. නමුත් ශේෂ පිරික්සුම නිවැරදිව පිළියෙල කර ඇත. | නිවැරදිව ලෙජර් ගිණුම් පිළියෙල කර ඒ අනුව ශේෂ පිරික්සුම සකස් කළ යුතු බව |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | -------- | ------ රු. | ---------------- | -------------------- | ---------- |
| (අ) | ගොඩනැගිලි | 1,288,187,598 | ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනාගැනීමට අදාල තොරතුරු | විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි තොරතුරු පවත්වාගෙන යා යුතු බව. |
| (ආ) | තාවකාලිකව නවතන ලද ආපසු ගෙවන තැන්පතු ශේෂය | 5,550,000 | ශේෂ සනාථ | ලෙජර් ගිණුමක විස්තර ඉදිරිපත් කර ඇත. | ශේෂ සනාථ කෙරෙන ලියකියවිලි ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ) | වියදම් | 1,455,790 | ගෙවීම් වවුචර 04ක් | රු.540,540 වූ ගෙවීම් වවුචරය ඉදිරිපත් කර නොමැත. නමුත් එසේ ඉදිරිපත් කළ යුතු ලියකියවිලි සියල්ල මෙම කොන්ත්‍රාත්තුවට අදාල ප්‍රසම්පාදන ලිපිගොනුවේ ඇතුළත් කර ඇත. | මුදල් රෙගුලාසි 272(3) ප්‍රකාරව සියලුම ගෙවීම් වවුචර විගණකාධිපති වෙත ඉදරිපත් කළ යුතු බව. |
| (ඈ) | ණයහිමි ශේෂ | 972,951 | ශේෂ සනාථ | ලෙජර් ගිණුමක විස්තර ඉදිරිපත් කර ඇත. | ණයහිමි ශේෂ නිවැරදි බව සනාථ කෙරෙන ලියවිලි ඉදිරිපත් කළ යුතු බව. |
| (ඉ) | සුළු මුදල් ගෙවීම් | 996,418 | බිල්පත් | ඊට අදාළ සියලු විස්තරයන් ප්‍රසම්පාදන ලිපි ගොනුවල පවති. | සුළු මුදලින් කළ ගෙවීම්වලට අදාල බිල්පත් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**නීතිරීති, රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මුදල් රෙගුලාසි 103 (i) | වටිනාකම හඳුනා ගත නොහැකි රු. 121,470 ක විදුලිජනක යන්ත්‍ර බැටරි 4 ක් නැතිවීම් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විදුලිජනක යන්ත්‍රයේ බැටරි 04 අස්ථානගත වී ඇති බව දැනගත් පසු පැලියගොඩ පොලීසියේ පැමිණිල්ලක් දමා ඇති අතර පොලීසිය විසින් මේ වන විට විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 103(i) ප්‍රකාරව නැතිවීම්වලට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කළයුතු බව. |
| ii. | මුදල් රෙගුලාසි 104 | භාරයේ හිටපු කළමනාකරු ප්‍රයෝජනයට ගෙන තිබුණු පණිවුඩ හුවමාරු යන්ත්‍රයක් 2018 වර්ෂය අවසානයේ සේවයෙන් ඉවත් වීමේ දී ආපසු භාර දී නොතිබුණි. ඒ සම්බන්ධයෙන් 2019 අගෝස්තු 13 දින පැලියගොඩ පොලීසියට පැමිණිලි කර තිබුණ ද මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකර නොතිබුණි. | පැලියගොඩ පොලීසියේ මේ සම්බන්ධව පැමිණිල්ලක් දමා ඇති අතර මේ පිළිබඳව විමර්ශන කටයුතු සිදු කිරීමට විමර්ශන නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූලික පරීක්ෂණ සිදුකළ යුතු බව. |
| iii. | මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ විස්තර සටහන් කිරීමට ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | රාජ්‍ය දේපල හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන යන ලෙස විෂය භාර නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාර හානි හා පාඩු පිළිබඳ ලේඛනය පවත්නා ගත යුතුබව. |
| iv. | මුදල් රෙගුලාසි 264 | 2,287,739 | සෑම මිලදී ගැනීමකට අදාල මුදල් කුවිතාන්සි හා ඒට අදාළ සියලු විස්තරයන් ප්‍රසම්පාදන ලිපි ගොනුවල පවති. දිමනා ගෙවීම් සම්බන්දව විස්තර සියල්ල මුදල් අංශය සතුව පවතී. | ආදායකයාට මුදල් ලැබුණු බවට කුවිතාන්සියක් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුබව. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි ලේඛනයක් පවත්වාගෙන යා යුතු බව. |
| (ඇ) | 2010 අගෝස්තු 10 දින කළමනාකරණ භාරය පිහිටුවීමේදී ඇති කරගත් ගිවිසුමේ 6(අ)(1) ඡේදය | භාරයේ අතිරික්ත මුදල් වෙනත් යම් ආකාරයකින් ආයෝජනය කිරීමට විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හා භාණ්ඩාගාරයේ පූර්ව ලිඛිත එකඟතාවයක් නොමැතිව 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 200.6 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | කළමනාකරණ භාරයේ තීරණයන්ට අනුව කටයුතු කර ඇත. | භාරය පිහිටුවීමේදී ඇති කරගත් ගිවිසුමේ 6(අ)(1) ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.21,507,832 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.18,620,437 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,887,395 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාරයේ ආරක්ෂක වියදම්, ජල පරිභෝජනය හා පිරිසිදු කිරීමේ සහ නඩත්තු වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම් ප්‍රවණතා | 2018 | 2017 | ප්‍රතිශතය සියයට | නිරීක්ෂණය |
|---|---|---|---|---|
| වාහන ගාල් කිරීමේ ආදායම | 2,772,482 | - | 100 | ධීවර සංස්ථාව විසින් සිදුකළ රථ ගාල් කිරීම් ආදායම් ලබාගැනීම සමාලෝචිත වර්ෂයේ සිට භාරයට ලැබීම. |
| **වියදම් ප්‍රවණතා** | | | | |
| ආරක්ෂක වියදම් | 8,940,945 | 6,813,539 | 31 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම. |
| ජල වියදම් | 7,629,040 | 5,076,189 | 50 | ප්‍රතිචක්‍රීය නොකරන මත්ස්‍ය කොටස් ඉවත්කිරීම සඳහා ජලය භාවිතා කිරීම. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------- | ----------- |
| (අ) | තොග වෙළඳ ව්‍යාපාරිකයින්ට පවරා තිබුණු වෙළඳසැල්වල බදු කාලය තුළ හෝ අවසානයේ දී තවදුරටත් බදු ගැණුම්කරු ව්‍යාපාරය පවත්වාගෙන නොයන්නේ නම් ඒ පිළිබඳ පරීක්ෂා කර භාරය වෙතට පවරාගෙන ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කරමින් මිල කැඳවීම් කර නැවත බදුදීමට භාරය විසින් කටයුතු කළ යුතුය. ඒ අනුව කටයුතු නොකර 2018 වර්ෂයේ බාහිර පාර්ශවයන් වෙත තොග වෙළඳසැල් 6 ක් පවරා ඒ වෙනුවෙන් රු.3,000,000 ක් ලබාගෙන තිබුණි. 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එසේ පවරා තිබූ වෙළඳසැල් ප්‍රමාණය 20 ක් වූ අතර, 2016 ට පෙර පවරා තිබූ වෙළඳසැල් 26 කින් කිසිදු මුදලක් භාරයට ලබාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළත් තොග වෙළඳ කුටියක, මාසික බදු මුදල සහ නැවත ගෙවීමේ මෙවැනි පැවරීම් කටයුතු ඇතැම් අතරමැදි පාර්ශවයන් විසින් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන බව වාර්තා වී ඇත. එවැනි පැවරීම් සීමා කිරීම සඳහා 2018 වර්ෂයේ සිට එසේ පැවරීමකදී රු. 500,000 මුදලක් කළමනාකරණ භාරය වෙත ගෙවිය යුතු බවට තීරණය කර ඇත. | ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කරමින් මිල කැඳවීම් කර නැවත බදු දීමටත් හා බදු කුලී නියමිත පරිදි අයකර ගැනීමටත් කටයුතු කළ යුතුබව. |
| (ආ) | වෙළඳ සංකීර්ණය පිහිටුවා ඇති හෙක්ටයාර් 3.1776 ක විශාලත්වයකින් යුත් ඉඩම, ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබාගත් ඉඩමකි. අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව එය භාරයට පවරාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ දී ද සිදුකර නොතිබුණු අතර, ඉඩමේ බුක්තිය පමණක් භාරය සතුව තිබුණි. | ඉංජිනේරු සංස්ථාවට මුදල් ගෙවා ඉඩමේ අයිතිය ලබා ගැනිමට මහා භාණ්ඩාගාරයෙන් මුදල් අනුමත නොකරන බැවින් එම මුදල කළමනාකරණ භාරයෙන් දැරිමටද හැකියාවක් නොමැති බැවින් ඉඩමේ භුක්තිය පමණක් භාරයට හිමිවිය. | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම භාරයට පවරා ගත යුතු බව. |
| (ඇ) | වෙළඳ පරිශ්‍රයේ රථ වාහන අංගනයේ ආදායම් එකතු කිරීමට ලංකා ධීවර සංස්ථාව පෞද්ගලික සමාගමක් සමඟ 2011 මාර්තු 07 දින සිට වර්ෂ 10 ක් දක්වා වූ කාලපරිච්ඡේදයක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. එහි 3.4 වගන්තිය අනුව මාසික ශුද්ධ ලාභයෙන් සියයට 40 ක් ලංකා ධීවර සංස්ථාවට ලැබිය යුතු බව දක්වා තිබුණ ද 2018 | විෂමතාවය වෙනස් කර සමානව ආදායම් බෙදී යා හැකි සංශෝධනයක් කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුලත් කිරීමට, කළමනාකරණ භාරය විසින් උපදෙස් ලබා දී ඇත. දැනට පවත්නා කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීමේ ශක්‍යතාවය පිළිබඳ | භාරය සතු වත්කම්වලින් භාරයට ආදායම් ලබාගැනීමට හැකිවන පරිදි ගිවිසුම සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මැයි දක්වා එම ආදායම් භාරයට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 2016 මැයි 17 දිනැති කළමනාකරණ භාර රැස්වීමේදී රථ වාහන අංශයෙන් භාරයට ලැබිය යුතු ආදායම, ශුද්ධ ආදායමින් සියයට 50 ක් විය යුතු බව තීරණය කර තිබුණ ද, 2019 අගෝස්තු වන විටත් ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ භාරය විසින් නීතිපති දෙපාර්තමේන්තුවෙන්ද උපදෙස් ලබා ගෙන ඇති අතර කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසීන් ප්‍රකාරව අදාළ ගිවිසුම අවසන් කිරීම දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇත. | |
| (ඇ) | 2017 වර්ෂයේ සිට ලංකා ධීවර සංස්ථාව කැට අයිස් ලබාදීම සිදුකර තිබුණු නමුත්, එම ආදායමෙන් කිසිදු ගාස්තුවක් භාරයට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම 2018 සැප්තැම්බර් වන විටත් මාලු තොග අලෙවි කුටි 6 ක්, මසුන් කැපීමේ කුටියක්, සිල්ලර කඩ කාමර එකක් හා අංක 1 ගොඩනැගිල්ලේ කාමර කොටසක් ලංකා ධීවර සංස්ථාව ප්‍රයෝජනයට ගෙන තිබුණත් ඒ සඳහා කිසිදු ගාස්තුවක් අය නොකිරීම හේතුවෙන් මසකට රු.80,000 ක පමණ ආදායමක් භාරයට අහිමි වී තිබුණි. තවද ලංකා ධීවර සංස්ථාවෙන් 2018 ජනවාරි 01 දිනට අයවීමට තිබුණු රු.17,402,781 ක මුදල ද සමාලෝචිත වර්ෂය තුළ දී අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව කළමනාකරණ භාර රැස්වීම්වලදී ලංකා ධීවර සංස්ථාවේ සභාපති තුමා දැනුවත් කිරීමට කටයුතු කර ඇතත් ලංකා ධීවර සංස්ථාව තුළ වර්තමානයේදී පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් මේ අවස්ථාවේදී අදාල මුදල් ගෙවීම අපහසු වී ඇත. | ලංකා ධීවර සංස්ථාව වෙතින් අයවිය යුතු මුදල් අය කරගත යුතු බව. |
| (ඉ) | වසර 5 කට වැඩි කාලයක සිට සිල්ලර අංශයේ තොග වෙළඳසැල් 64 න්, 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.18,232,333 ක හිඟ බදු කුලිය 2018 වර්ෂය තුළදී ද අයකර නොතිබිය දී ඒ අතරින් වෙළඳසැල් 9 ක් නැවත බදුදීම මඟින් 2018 දෙසැම්බර් 31 දිනට හිඟහිට තිබූ බදු මුදල තවත් රු.950,000 කින් වැඩි වී තිබුණි. | 2011 වර්ෂයේ සිට සිල්ලර අංශයේ තොග වෙළඳ කුටි 64 හි ව්‍යාපාරික කටයුතු ක්‍රියාත්මක මට්ටමේ නොපැවති අතර නව හිමිකරුවන් හට වෙළඳ කුටි ලබාදීම සිදුකරනු ලැබුව ද මේ වන තෙක් සිල්ලර අංශයේ වෙළඳාම් කටයුතු සාර්ථක මට්ටමේ නොපවතී. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------- | ----------- |
| (අ) | වෙළඳ සංකීර්ණය තුළ තොග වෙළඳසැල් 154 ක් හා සිල්ලර වෙළඳසැල් 128 ක් ඉදිකර තිබුණු අතර, එයින් සිල්ලර වෙළඳසැල් 64 ක් රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණි. එසේ වුවද 2019 සැප්තැම්බර් 17 දින වන විට සිල්ලර අංශයේ වෙළඳසැල් 3 ක් හා සිල්ලර අංශයේ තොග වෙළඳසැල් 33 ක් අලෙවි කටයුතු සඳහා යොදා නොගන්නා බව නිරීක්ෂණය විය. | මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ සිල්ලර මත්ස්‍ය වෙළඳාම දුර්වල මට්ටමක පවතින බැවින් මෙම අංශයේ වෙළඳ කුටි බදු ගැනීමට ගැණුම්කරුවන් විසින් ඉදිරිපත් නොවන අතර දැනට වෙළඳ කුටි ලබා ගෙන ඇති ගැණුම්කරුවන් පවා එම වෙළඳ කුටිවල ව්‍යාපාරික කටයුතු සිදු කරනු නොලබයි. | සිල්ලර මත්ස්‍ය වෙළඳාම වැඩි දියුණු කිරීමට උපක්‍රම යෙදිය යුතු බව. |
| (ආ) | පණිවුඩ හුවමාරු යන්ත්‍ර 5 ක් වසරකට වැඩි කාලයක සිට භාවිතයෙන් තොරව පැවතියද ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.52,900 ක් වැයකර බැටරි මිලදීගෙන තිබුණි. | මෙම කාලපරාසය තුළ භාරයේ කළමණාකරු අක්‍රිය තත්ත්වයේ පැවැති පණිවුඩ හුවමාරු යන්ත්‍ර අලුත්වැඩියා කර භාවිතයට ගන්නා ලෙස වැඩ පරික්ෂක මහතුන්ට උපදෙස් ලබා දෙන ලදී. | භාවිතයට නොගන්නා උපකරණවලට තවදුරටත් වියදම් නොකළ යුතු බව. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------- | ----------- |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අංක 2.4.1, 2.11.1, 3.4, 6.3.3,7.7 හා 8.9.1 මාර්ගෝපදේශයන් අනුගමනය නොකර සමාලෝචිත වර්ෂයේ මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අංක 01 ගොඩනැගිල්ලේ සිවිලිම අලුත්වැඩියා කිරීමේ රු.2,450,000 ක කොන්ත්‍රාත්තුව ද තොග අංශයේ පොළව අලුත්වැඩියා කිරීමේ රු.2,366,000 ක කොන්ත්‍රාත්තුව ද ශීතාගාරය හා පතුරු අයිස් යන්ත්‍රාගාරය රු.525,000 ක මාසික | • මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දැන්වීමක් පල කිරීමට අමතරව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2017 වර්ෂයට අදාලව ලියාපදිංචිව සිටි කොන්ත්‍රාත් ආයතනයන් වෙතද යොමු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.4.1, 2.11.1, 3.4, 6.3.3,7.7 හා 8.9.1 හි සඳහන් ක්‍රියාපරිපාටි අනුගමනය කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | කුලියකට බදු දීමේ කොන්ත්‍රාත්තුව හා මසුන් කැපීමේ ලෑලි 44 ක් රු.1,320,000 කට මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව ද පෞද්ගලික අංශයට පිරිනමා තිබුණි. | • තාක්ෂණික ඇගයීම් වාර්තාවට අනුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් අදාල කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සුදුසු බව තීරණය කර ඇත.<br><br>• පළමු ලංසු කැඳවීමේදී භාවිතා කරන ලද ප්‍රමාණ පත්‍රයෙහි සිදුකළ යුතු කාර්යයන් රැසක් සඳහන්ව නොතිබීමේ තාක්ෂණික දෝෂ ගණනාවක් පැවති හෙයින් ලංසුකරුවන් විසින් වර්ග අඩියකට අඩු මිලක් ඉදිරිපත් කර තිබේ. පසුව වැඩි මිලක් ඉදිරිපත් කර තිබේ. | |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.2 මාර්ගෝපදේශය අනුව භාරය සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවන්හි වගකීම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පවරා ගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විගණන වාර්තාවේ අදාල කරුණු ක්‍රියාත්මක කිරීමට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.2 මාර්ගෝපදේශය අනුව භාරය සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවන්හි වගකීම අමාත්‍යාංශය භාර ගත යුතු බව. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | --------------------- | ------------------ | ----------- |
| (අ) | වෙළඳ සංකීර්ණයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ලංකා ධීවර සංස්ථාවේ සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලවලින් හඳුනාගත් නිලධාරීන් හා සේවකයන් පමණක් කළමනාකරණ භාරයේ තනතුරු සඳහා අනුයුක්ත කර ගත යුතු බව 2010 මැයි 26 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර තිබුණි. එසේ වුවද කළමනාකරු (මෙහෙයුම්) තනතුර සඳහා බාහිර පුද්ගලයන් දෙදෙනෙකු බඳවා ගෙන 2018 වර්ෂය තුළදී එකතුව රු.1,193,370 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | ආයතනික අවශ්‍යතාවය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ කළමනාකරණ භාරයේ අනුමැතිය සහිතව උක්ත තනතුරු දෙක සකස් කර භාරයේ අනුමැතිය සහිතව එකී බඳවා ගැනීම් සිදු කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුමැතිය පරිදි භාරයේ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාරයේ කළමණාකරු තනතුර, ගණකාධිකාරි තනතුර හා අභ්‍යන්තර විගණක තනතුර සඳහා විධිමත්ව බඳවා නොගැනීම හේතුවෙන් නිවැරදිව ආදායම් ලබා ගැනීමටත්, නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නියමිත දිනවලදී විගණනය සඳහා ඉදිරිපත් කිරීමටත් නොහැකිවී තිබුණු අතර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් ප්‍රකාශ කිරීමටත් නොහැකි වී තිබුණි. | භාරයේ තනතුරු සඳහා බඳවා ගැනිමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිපත් කළ නමුත් එය අනුමත කල නොතිබුණි. කළමණාකරුවකු සහ ගණකාධිකාරි වරයෙකු අලුතින් බඳවා ගැනිමේදි එම නිලධාරින් වෙත වැටුප් ගෙවිම සඳහා මාසිකව ලක්ෂ තුනකට ආසන්න මුදලක් වැය කිරීමට සිදුවේ. එම තනතුරුවල වැඩ බලන නිළධාරින් දෙදෙනෙක් සඳහා වැය වන්නේ රුපියල් පනස්දාහක් පමණ වේ. | භාරය විධිමත් ආකාරයෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය පුරප්පාඩු වූ තනතුරුවලට බඳවා ගැනීම් කළ යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2018 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව රහිත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ 2019 සැප්තැම්බර් 25 දින දීය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | චක්‍රලේඛය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව. |

### 4.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවර්ධන කටයුතු හා වාණිජ කටයුතු වෙන වෙනම හඳුනා ගනිමින් භාරයේ ස්ථාපිත අරමුණු ඉටුකර ගැනීම සඳහා තිබෙන ශක්තීන් මෙන්ම දුර්වලතා මනා ඇගයීමට ලක්කර නොතිබීමත්, ව්‍යාපාරික පරිසරය සංවර්ධනය කිරීමටත්, සහ ඒ සඳහා ඇති බාධක පිළිබඳ මනා ඇගයීමක් සිදු නොකිරීම නිසා භාරයේ | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ඉදිරි වර්ෂ සඳහා අඛණ්ඩව ගෙන යන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කළ යුතු බව. |

අරමුණු ඉටුකර ගැනීම සඳහා උචිත ක්‍රමෝපායන් හඳුනාගෙන නොතිබුණි. තවද, අවශ්‍ය පරිදි එම සැලැසුම් යාවත්කාලීන කර ඉදිරි වර්ෂ සඳහා අඛණ්ඩව ගෙන යන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි.

**4.3** <u>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලසුමක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් ඉදිරිපත් කිරිම සඳහා විශාල ප්‍රාග්ධන වියදම් කළමනාකරණ භාරය විසින් සිදු කරන්නේ නැත. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතු බව. |

**4.4** <u>අභ්‍යන්තර විගණනය</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව කළමනාකරණ භාරයේ අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා පද්ධති හා පාලනය ශක්තිමත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කළමනාකරණ භාරයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා පද්ධති හා පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතු බව. |

**4.5** <u>අයවැය පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 ජුනි 22 දිනැති පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව පිළියෙල කළයුතු වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2018 සඳහා අයවැය ලේඛණයක් සකස්කර කළමනාකරණ භාරය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කළ යුතු බව. |

**4.6** <u>පාරිසරික ගැටලු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | පරිසරයට හානියක් නොවන පරිදි මත්ස්‍ය නොවන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම විගණනය සිදුකරන දින විටත් නිසි පරිදි සිදු නොවන බව නිරීක්ෂණය විය. | මත්ස්‍ය නොවන ඝණ අපද්‍රව්‍යයන් පරිසරයට හානිදායක නොවන අයුරින් ප්‍රතිචක්‍රීයකරණය කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රියාමාර්ගයන් අදාල ආයතනය විසින් මේ වන විට ක්‍රියාත්මක කර ඇත. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයේ දී පරිසරයට හානිදායක නොවන ක්‍රමයක් අනුගමනය කළ යුතු බව. |
| (ආ) | පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයට අදාලව උද්ගත වී ඇති පාරිසරික ගැටලු සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමේ අයදුම්පත 2014 මාර්තු 18 දින ඉදිරිපත් කර තිබුණ ද, ඒ සඳහා වර්ෂ 5ක් ඉක්මගොස් ඇතත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා දී නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීම සඳහා මේ වන විට කටයුතු සකස් කරමින් පවති. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතු බව. |

**4.7** <u>තිරසාර සංවර්ධන අරමුණු</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සාමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණ ද, ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණු අතර නිවැරදි දත්ත ලබා ගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ද හඳුනා ගෙන නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගැනීමටත් නිවැරදි දත්ත ලබා ගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් හඳුනා ගැනීමටත් කටයුතු කළ යුතු බව. |